# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2462/35 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වගන්තිය යටතේ වූ පවරා ගැනීමේ නියෝගය අවලංගු කිරීම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වගන්තිය යටතේ එවකට මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල ප්‍රකාර, 2017.06.27 දිනැති අංක 2025/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ 15 (1) වන වගන්තිය යටතේ නියමයෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු කරනු ලැබීය.

එනමුත්, නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යයන් සඳහා අධිකාරියට එකී දේපළ අවශ්‍ය නොවන බවට ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා වන බිමල් නිරෝෂන් රත්නායක වන මම තීරණය කරන හෙයින්, අංක 2025/18 සහ 2017.06.27 වැනි දින රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත 15(1) වගන්තිය යටතේ වූ නියෝගය මෙයින් අවලංගු කරමි.

**බිමල් නිරෝෂන් රත්නායක** (පා.ම),
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 03 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
12 මහල, සෙත්සිරිපාය, අදියර II,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ අංක 07, නුගේගොඩ කොට්ඨාසයේ පිහිටියා වූ ද, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ඩී. ජෝයි ද සිල්වා මහතා විසින් පිළියෙල කරන ලද අංක 70/2008 හා 2008.08.30 දිනැති සැළසුමෙහි කැබලි අංක 'A' ලෙස සවිස්තරව පෙන්නුම් කර ඇත්තා වූ ද ප්‍රමාණයෙන් (අක්. 02-රූඩ් 01 - පර්.10.00) හෙක්. 0.9373 ක් වූ ඉඩම

ඉඩම පහත පරිදි මායිම් වේ:

*උතුරට* : ස්ටැන්ලි තිලකරත්න මාවත සහ පරණ කැස්බෑව පාර;

*නැගෙනහිරට* : පරණ කැස්බෑව පාර;

*දකුණට* : පාර;

*බටහිරට* : ස්ටැන්ලි තිලකරත්න මාවත,

EOG 11 - 0103